**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා දත්ත සමුදා සේවාපරිගණක (Database Servers) 04 ක්, දත්ත ගබඩා (Storages) 02 ක්, ටේප් ලයිබ්‍රරි (Tape Library) 02 ක් සහ රාක්ක (Racks) 02 ක් සැපයීම, ගෙනෙවිත් භාරදීම, ස්ථාපනය කිරීම, ඒකාබද්ධ කිරීම, දත්ත සංක්‍රමණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය.**

## (ද්විත්ව කවර ක්‍රමවේදය)

## IFB අංකය : DIE/PRO/03/2025/35

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපතිවරයා විසින් දත්ත සමුද සේවාපරිගණක 04 ක්, දත්ත ගබඩා 02 ක්, ටේප් ලයිබ්‍රරි 02 ක් සහ රාක්ක 02 ක් සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය කිරීම, ඒකාබද්ධ කිරීම, දත්ත සංක්‍රමණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ (ද්විත්ව කවර ක්‍රමවේදය) ලංසු කැඳවනු ලැබේ.

2. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත වූවෙකු නොවිය යුතුය.යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායක පහත පරිදි වේ. (අතිරේක සුදුසුකම් අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත):

**අ) පොදු අවශ්‍යතා:**

i. සමාන ස්වභාවයේ නිෂ්පාදන සැපයීම, ස්ථාපනය කිරීම, ඒකාබද්ධ කිරීම, දත්ත සංක්‍රමණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් ලංසුකරුට අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබිය යුතුය.

ii. එදිනම හෝ ඊළඟ දිනයේදීම දෘඩාංග ප්‍රතිස්ථාපනය සහතික කිරීම සඳහා, මූලික නිෂ්පාදකයා විසින් නඩත්තු කරනු ලබන අවම වශයෙන් එක් නඩත්තු වැඩපළක් හෝ දේශීය අමතර කොටස් ගබඩාවක් ලංසුකරු සතුව තිබිය යුතුය.මෙම පහසුකම ලංසුකරු සතු සහ ඔහු විසින් කළමනාකරණය කරනු ලබන්නක් විය යුතුය.

iii. ලංසුකරු විසින්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත්තු පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

**ආ) සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තු පිළිබඳ විශේෂ පළපුරුද්ද:**

ලංසුකරු /හවුල් ව්‍යාපාරික සහකරු විසින් ඔරකල් දත්ත සංක්‍රමණය (Oracle Data migration) ඇතුළුව, සමාන ස්වභාවයේ ප්‍රසම්පාදන සැපයීම, ස්ථාපනය කිරීම, ඒකාබද්ධ කිරීම, දත්ත සංක්‍රමණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධ කොන්ත්‍රාත්තු දෙකක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ සඳහා නිර්දේශ ලිපි ඉදිරිපත් කළ යුතුය.

එක් එක් ව්‍යාපෘතියේ අවම වටිනාකම රුපියල් මිලියන සියයකට (ලංරු. මිලියන 100 ) නොඅඩු විය යුතු අතර, අවම වශයෙන් ලංසු භාරගන්නා අවසන් දිනයට පෙර අවසන් වසර පහ (05) ඇතුළත ව්‍යාපෘතිය සම්පූර්ණ කර තිබිය යුතුය.

**ඇ) තත්ත්ව සහ ආරක්ෂණ අවශ්‍යතා:**

දෘඩාංග නිෂ්පාදකයා ISO 9001:2015 සහතික ලත් අයෙකු විය යුතු අතර, දෘඩාංග ලංසුකරු හෝ හවුල් ව්‍යාපාරික සහකරු ISO 27001:2022 සහතික ලත් අයෙකු විය යුතුය.

**ඈ) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම:**

පසුගිය වසර තුන (3) ඇතුළත විගණනය කරන ලද මූල්‍ය වාර්තා මගින් සනාථ වන පරිදි, ලංසුකරුට අවම වශයෙන් රුපියල් මිලියන හත්සිය පනහක (ලංරු. මිලියන 750 ) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතුය.

**ඉ) මූල්‍ය සම්පත්:**

පසුගිය වසර පහ (5) පුරා සාමාන්‍ය කාරක ප්‍රාග්ධනය (ජංගම වත්කම් – ජංගම වගකීම්) රුපියල් මිලියන දෙසිය පනහක් ( 250 ) විය යුතුය, නැතහොත් මෙම ව්‍යාපෘතිය සඳහා ලංසුකරුගේ අනෙකුත් කොන්ත්‍රාත් බැඳීම් හැර තිබිය යුතු, රුපියල් මිලියන හාරසියයකට (400 ) නොඅඩු මුදල් ප්‍රවාහ අවශ්‍යතාව සපුරාලීම සඳහා ද්‍රවශීල වත්කම්, ණය පහසුකම් හෝ වෙනත් මූල්‍ය මාධ්‍යයන් වැනි මූල්‍ය සම්පත් සඳහා ප්‍රවේශය හෝ පවතින බව පෙන්විය යුතුය.

**ඊ) යෝජිත විසඳුම හුවමාරු කිරීමේ අවම කාල සීමාව:**

පද්ධතිය අක්‍රිය වන කාලය (Downtime) අවම කිරීම සඳහා ලංසුකරුගේ යෝජනාව අවසාන අවම හුවමාරු කිරීමේ කාල සීමාව වන පැය 2 ක කාලයට ගැළපිය යුතුය.

3. උනන්දුවක් දක්වන සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා 0112 – 101515 දුරකථන අංකය හරහා ලබා ගත හැක. 2026.06.16 දින සිට 2026.07. 06. දින දක්වා 4 වන ජේදයේ දක්වා ඇති ලිපිනයේදී සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.immigration.gov.lk) හරහා ලංසු ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

4. නැවත නොගෙවන ගාස්තුව රුපියල් හැට දහසක් (ලංරු. 60,000.00) ක් ගෙවීමෙන් අනතුරුව , බත්තරමුල්ල , ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය", 05 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ප්‍රසම්පාදන අංශය, නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2026.06.16 දින සිට 2026. 07. 06 දින දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, මිලදී ගත හැක. ගෙවීම් ක්‍රමය මුදලින් විය යුතුය.

5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස වෙන වෙනම කවරවල බහා, පසුව එම කවර දෙක තනි කවරයක බහා, එම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත් නාමය සහ IFB අංකය පැහැදිලිව සටහන් කර, 2026.07.07 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර 4 වන ජේදයේ දක්වා ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය නැතහොත් ගෙනවිත් භාර දිය යුතුය.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහම, එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසු කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් 2026.07.07 දින ප.ව. 2.00 ට 4 වන ජේදයේ දක්වා ඇති ලිපිනයේදී ලංසු විවෘත කරනු ලැබේ.

6. සියලුම ලංසු සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද රුපියල් මිලියන පහක (ලංරු. 5,000,000/-) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් ආකාරයෙන් වූ ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

7. පූර්ව ලංසු රැස්වීම **2026.06.23 දින පෙ.ව. 11.00 ට** බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය" 07 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, දී පැවැත්වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**
**18 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**